# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින.]

එල්. ඩී.—ඕ. 47/2002.

**යොවුන් සේනාංකයක් පිහිටුවීම සඳහා ද, තරුණ කටයුතු සඳහා සභාවක් පිහිටුවීම සඳහා ද සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු ද සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

### I වන කොටස

### යොවුන් සේනාංක සභාව

2. (1) (මෙහි මින් මතු සභාව යනුවෙන් සඳහන් කරනු ලබන) යොවුන් සේනාංක සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර එම සභාව අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් ගෙන් එක් අයකු කාන්තාවක් විය යුතු ය. තවද අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයන් පස් දෙනා අතරින් එක් අයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. යොවුන් සංවර්ධනය, සේවා නියුක්තිය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල දැනුම සහ පළපුරුද්ද ඇති තැනැත්තන් අතරින් ඒ සාමාජිකයන් තෝරා ගනු ලැබිය යුතු ය. යොවුන් සේනාංක සභාව පිහිටුවීම.

(2) සභාවේ පරිපාලනය සම්බන්ධයෙන් වූ සියලු කරුණු නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(3) සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

(4) සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තීය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු තුනක් පත් කරනු ලැබිය යුතු ය. සභාව විසින් ස්වකීය බලතල ඒ කමිටුවලට පවරනු ලැබිය හැකි ය.

(5) ඒ කමිටුවල සංයුතිය සහ ඒ කමිටු මගින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

යොවුන් සේනාංකයේ අරමුණු.

**3.** යොවුන් සේනාංකය යෞවනයන් සඳහා වන හමුදාමය නොවන සංවිධානයක් විය යුතු අතර එයට පහත සඳහන් අරමුණු තිබිය යුතු ය :–

(අ) යොවුන් සංවර්ධනය සහ ඊකියා පුහුණුව ; සහ

(ආ) වෘත්තීයමය අධ්‍යාපනය.

සභාවේ බලතල.

**4.** සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :–

(අ) යොවුන් සේනාංකය සඳහා සැලසුම් සහ වැඩපිළිවෙල සකස් කිරීම ;

(ආ) (අ) ඡේදය යටතේ පිළියෙල කරනු ලැබ, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සැලසුම් සහ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම පිළිබඳව නියාමනය කිරීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම ;

(ඇ) යොවුන් සේනාංකයේ සාමාජිකයන්ගේ පුහුණුව අධීක්ෂණය කිරීම ;

(ඈ) යොවුන් සේනාංකයේ අධ්‍යක්ෂවරයා විමසා සේනාංකයේ සාමාජිකයන්ගේ පුහුණුවට සහ කාර්යක්ෂමතාවට අදාළ කොන්දේසි සහ පුහුණුවන්නා විසින් අත්කර ගැනීමට නියමිත නිපුණතාවේ ප්‍රමාණය නිශ්චිතව දැක්වීම.

## II වන කොටස

### යොවුන් සේනාංකය

යොවුන් සේනාංකය.

**5.** මේ පනතේ විධිවිධානවලට අනුකූලව (මෙහි මින් මතු "සේනාංකය" යනුවෙන් සඳහන් කරනු ලබන) යොවුන් සේනාංකය යනුවෙන් හඳුන්වනු ලබන සේනාංකයක් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

6. (1) අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ඒකක වලින් සහ පුහුණුවන්නන් සංඛ්‍යාවකින් සේනාංකය සමන්විත විය යුතු ය.

සේනාංකවල ඒකක ශක්තිය අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

(2) සේනාංකයේ ව්‍යුහය සහ නිල ද ඒ නිලවලට කරනු ලබන පත් කිරීම්, දෙනු ලබන උසස්වීම් සහ නිලවලින් පහත දැමීම් නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

7. සේනාංකයේ අධ්‍යක්ෂවරයා ලෙස අමාත්‍යවරයා විසින් සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා සේනාංකයේ පරිපාලනය, පුහුණුව, විනය කටයුතු සහ කාර්යක්ෂමතාව පිළිබඳව වගකිව යුතු ය.

සේනාංකයේ අධ්‍යක්ෂවරයා.

8. සේනාංකයේ අධ්‍යක්ෂවරයා විසින්-

සේනාංකයේ අධ්‍යක්ෂවරයාගේ කාර්යය.

(අ) සභාවේ තීරණ බලාත්මක කළ යුතු අතර සභාවේ තීරණ බලාත්මක කරන බවට වගබලාගත යුතු ය ;

(ආ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්ය ඉටු කිරීම සඳහා ද සභාවට අවශ්‍ය විය හැකි තොරතුරු සභාව වෙත සැපයිය යුතු ය.

9. සේනාංකයේ නිලධරයන් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් නිලධරයන් පත් කළ යුතු බව.

10. සන්නද්ධ සේවාවල, පොලිස් බලකායේ, රජයේ සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවල යොවුන් සංවර්ධනය හා රැකියා පුහුණුව පිළිබඳ විශේෂ දක්ෂතා ඇති යම් සාමාජිකයකු සේනාංකයේ සේවය සඳහා පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීන පදනම මත මුදා හරිනු ලැබිය හැකි අතර ඒ සාමාජිකයා, නියම කරනු ලැබිය හැකි නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

සේනාංකයේ සේවය සඳහා නිලධරයන් ආදිය මුදා හැරීම.

11. පුහුණුවන්නකු ලෙස සේනාංකයට ස්වේච්ඡා සේවය ලබාදීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් වයස අවුරුදු දහඅටට නොඅඩු සහ විසිඅටට නොවැඩි තැනැත්තන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබිය හැකි ය. මේ වගන්තියේ විධිවිධාන අදාළ වනුයේ යම් තැනැත්තන්ට ද ඒ තැනැත්තන් තෝරා ගැනීමේ ක්‍රමය, නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

සේනාංකයට ස්වේච්ඡා සේවකයන් බඳවා ගැනීම.

බඳවාගනු ලැබූ කාල සීමාව අවසන් වීමේ දී පුහුණුවන්නන් නිදහස් කළ යුතු බව.

**12.** යම් පුහුණු වන්නකු බඳවාගනු ලැබුවේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව අවසන්වීමේ දී ඒ පුහුණුවන්නා, මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලට යටත්ව, සේනාංකයෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. එසේ නිදහස් කරනු ලැබූ පුහුණුවන්නකු නැවත බඳවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් එය ඒ සඳහා එළඹෙන ලද ගිවිසුමක් මගින් සිදු කරනු ලැබිය හැකි ය.

සේනාංකයේ පුහුණුවන්නන්ගේ විනය.

13. (අ) අධිකාර බලය ඕනෑකමින් ම නොතකන බව පෙන්නුම් කරන ආකාරයෙන් හැසිරෙන, තමන්ට නිලධරයකු විසින් දෙන ලද හෝ පෞද්ගලිකව දැනුම් දෙන ලද යම් නීත්‍යානුකූල අණකට අකීකරු වන ; හෝ

(ආ) මේ පනත යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් කඩකරන නැතහොත් ඊට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින,

යම් පුහුණුවන්නෙක් නියම කරනු ලැබිය හැකි පරිදි වූ ආකාරයට විනයානුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

සේනාංකයේ නිලධරයන්ගේ සහ පුහුණු වන්නන්ගේ දීමනා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

**14.** අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සේනාංකයේ නිලධරයන්ගේ සහ පුහුණුවන්නන්ගේ පාරිශ්‍රමික සහ වෙනත් දීමනා තීරණය කරනු ලැබිය යුතු ය.

සේනාංකයේ දේපළ සේනාංකයේ අධ්‍යක්ෂවරයා වෙත සතු විය යුතු බව

**15.** සේනාංකයේ තනි සාමාජිකයන්ගේ දේපළ හැර සේනාංකයට අයත් සියලු දේපළ ද සේනාංකයට හෝ සේනාංකයේ යම් කොටසකට අයවිය යුතු මුදල් සහ වෙනත් දේපළ නඩු පවරා අයකර ගැනීමේ අනන්‍ය අයිතිය ද ඒ දේපළට අදාළව නඩුපැවරීම, ගිවිසුම් සහ හිමිකරණයන්වලට එළඹීම් සහ වෙනත් සියලු නීත්‍යානුකූල දේ කිරීමේ බලය ද සේනාංකයේ අධ්‍යක්ෂවරයා වෙත සතු විය යුතු අතර මේ වගන්තිය ප්‍රකාරව සේනාංකයේ අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් ඒ අධ්‍යක්ෂවරයා මිය යාම, ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම යන හේතු නිසා නවතා දමනු නොලැබිය යුතු අතර, ඒ සිවිල් හෝ අපරාධ නඩු අවසන් නොවිය යුතු ය. තවද එම සිවිල් හෝ අපරාධ නඩු ඔහුගේ ධුරයේ අනුප්‍රාප්තිකයා විසින් සහ ඒ අනුප්‍රාප්තිකයාගේ නමින් පවත්වාගෙන යා යුතු ය.

16. (1) යම් රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් රජයේ ආයතනයක සාමාන්‍ය ක්‍රියාකාරකම් වන සේවා, සේනාංකය වෙත ලබාදෙන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් ඒ රජයේ දෙපාර්තමේන්තුවට, රාජ්‍ය සංස්ථාවට, ව්‍යවස්ථාපිත මණ්ඩලයට හෝ වෙනත් රජයේ ආයතනයට විධාන කරනු ලැබිය හැකි ය. අමාත්‍ය මණ්ඩලයේ බලතල.

(2) එම සේවා ලබාදිය යුතු ආකාරය සලකා බැලීම සඳහා, අවශ්‍ය යයි අමාත්‍ය මණ්ඩලය විසින් සලකනු ලබන කමිටු සංඛ්‍යාවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය. ඒ කමිටුවල කර්තව්‍ය සහ ඒ කමිටු මගින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### සාමාන්‍ය

17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සේනාංකයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ගිණුම් විගණනය.

18. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) සේනාංකයේ සාමාජිකයන් පත්කිරීම සහ සංවිධානය, පාලනය, පරිපාලනය සහ විනය කටයුතු :

(ආ) සේනාංකයේ සාමාජිකයන් විසින් ඇඳිය යුතු නිල ඇඳුම් :

(ඇ) පුහුණුවන්නන් පුහුණු කිරීම :

(ඈ) සේනාංකයේ යම් ඒකකයක් සම්පූර්ණයෙන් ම හෝ යම් ඒකකයක යම් කොටසක් විසුරුවා හැරීම :

(ඉ) පුහුණුවන්නකුගේ සාමාජිකත්වය සඳහා වයස සහ වෙනත් සුදුසුකම්, පුහුණුවන්නන්ගේ නිලයේ උසස්වීම්, නිලයේ නැගීම හෝ බැසීම සහ පුහුණුවන්නන්ගේ සේවය නිම කිරීම :

(ඊ) පුහුණුවන්නකු හැර සේනාංකයේ යම් සාමාජිකයකුගේ සේවය අවසන් කිරීම :

(උ) සභාව විසින් පත් කරනු ලබන කමිටුවල ස්ථාපනය සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සහ ඒ කමිටුවල සංයුතිය :

(ඌ) නියෝග සාදනු ලැබීම සඳහා නියම කරනු ලැබිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ඒ නියෝගය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය. ඒ නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**19.** මේ පනතේ කාර්ය සඳහා ''යොවුන් තැනැත්තා'' යන්නෙන්, වයස අවුරුදු දහඅටට නොඅඩු සහ විසිඅටට නොවැඩි තැනැත්තෙක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස !5 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.